# නිවේදනයයි.

Faculty of Management Studies and Commerce
Dean's Office
23 FEB 2023
Nugegoda
University of Sri Jayewardenepura

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා පීඨ මණ්ඩල නියෝජිත නිලවරණය පැවැත්වීමට අදාළව කරනු ලබන නිවේදනයයි.

2021/2022 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සඳහා පීඨ මණ්ඩල නියෝජිතයින් දෙදෙනෙකු තෝරා පත් කර ගත යුතුව ඇත.

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ නිලවරණයකදී ඡන්දය දීමට සුදුසුකම් ලබා ඇති ශිෂ්‍යයන්ගේ නාම ලේඛනය පරීක්ෂා කර බැලීම සඳහා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ කාර්යාලයේ තබා ඇත.

ශිෂ්‍ය සමිති හා පීඨ මණ්ඩල නියෝජිතයින් සඳහා නාම යෝජනා භාරගනු ලබන දිනය හා වේලාව යථා කාලයේ දී ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ලේඛකාධිකාරී

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල,
නුගේගොඩ.

2023.02.21

# නිවේදනයයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා පීඨ ශිෂ්‍ය සමිති නිලවරණය පැවැත්වීමට අදාළව කරනු ලබන නිවේදනයයි.

ඉහත අධ්‍යයන වර්ෂයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා නිලධාරීන් පහත සඳහන් පරිදි තෝරාගත යුතු ය.

01. සභාපති
02. උප සභාපති
03. ලේකම්
04. සංස්කාරක
05. කණිෂ්ඨ භාණ්ඩාගාරික
06. වෙනත් සාමාජිකයන් 08 දෙනෙක්

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ ශිෂ්‍ය සංගමයේ නිලධාරීන්ගේ හා වෙනත් සාමාජිකයින් තෝරා පත් කර ගැනීමේ නිලවරණයක දී ඡන්දය දීමට සුදුසුකම් ලබා ඇති ශිෂ්‍යයන්ගේ නාමලේඛනය පරීක්ෂා කර බැලීම සඳහා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ කාර්යාලයේ තබා ඇත.

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා නාමයෝජනා භාරගනු ලබන දිනය හා වේලාව යථා කාලයේ දී ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ලේඛකාධිකාරී

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල,
නුගේගොඩ.

2023.02.21

# දැන්වීමයි

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## 2021/2022 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් පැවැත්වෙන පීඨ ශිෂ්‍ය සමිති නිලවරණය.

2021/2022 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සඳහා පැවැත්වෙන පීඨ ශිෂ්‍ය සමිති සහ පීඨ මණ්ඩල නියෝජිත නිලවරණයට නාම යෝජනා පත්‍ර බාර ගැනීම 2023.03.07 දින පෙ.ව. 09.30 සිට පෙ.ව. 10.30 දක්වා පහත සඳහන් ස්ථානයේ දී සිදු කරනු ඇත.

01. අංක 03 ඡන්ද කොට්ඨාශට - කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
නාම යෝජනා පත්‍ර භාර ගැනීම - කළමනාකරණ පීඨයේ පීඨාධිපති මහාචාර්ය පී.ඩී. නිමල් මහතා
නාම යෝජනා භාර ගන්නා ස්ථානය - කළමනාකරණ පීඨ කාර්යාලය
නාම යෝජනා භාර ගන්නා දිනය - 2023.03.07
නාම යෝජනා භාර ගන්නා කාල සීමාව - පෙ.ව. 09.30 සිට පෙ.ව. 10.30 දක්වා

නාම යෝජනා පත්‍ර භාරදීමේ දී අදාළ සියලුම අපේක්ෂකයන් තම ශිෂ්‍ය වාර්තා පුස්තකය හෝ විශ්වවිද්‍යාලයීය හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු බව සලකන්න.

02. 2023.02.23 දින පෙ.ව. 09.30 සිට 2023.03.07 දින පෙ.ව. 9.15 දක්වා කාර්යාල වේලාවන් තුළ දී පීඨ කාර්යාලයෙන් අදාළ නාම යෝජනා ඉල්ලුම් පත් නිකුත් කරනු ලැබේ.

03. නාම යෝජනා සඳහා විරෝධතා ඉදිරිපත් කිරීම.

ඉදිරිපත් කළ නාම යෝජනා සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් වෙතොත් එම විරෝධතා 2023.03.07 වෙනි දින පෙ.ව. 10.30 න් පසුව එළැඹෙන පැය භාගයක් කාලය තුළ දී කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති, නිලවරණ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු ය. එම කාලයට පසුව ලැබෙන විරෝධතා සලකා බලනු නො ලැබේ.

ලේඛකාධිකාරී

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල,
නුගේගොඩ.

2023.02.21